**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් සහ යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම සඳහා වැය කරන ලද එකතුව රු. 18,122,387 ක වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අදාල ලිපි ලේඛන පරීක්ෂා කර බලා 2021 ගිණුමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල සියළු මූලධන වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) | දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය ගිණුමේ ශේෂය, මෙහෙයුම් වියදම් හා ප්‍රාග්ධන වියදම් පිළිවෙලින් රු. 60,806, රු. 11,340, හා රු. 49,466 කින් වැඩියෙන් දක්වා තිබුණි. | සියළු නිවැරදි කිරීම් 2021 අවසන් ගිණුම සකස් කරන විට සිදු කරන බව. | ණය වාරික හා පොළී ගෙවීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල උපචිත වියදම් රු. 115,603 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර, ඉදිරි වර්ෂයට අදාල වියදම් රු. 111,425 ක් සමාලෝචිත වර්ෂයට අදාලව උපචිත කර තිබුණි. | උපචිත මුදල අතපසු වීමකින් ණය හිමියන් සඳහා වෙන්කර ගැනීමට නොහැකි වී තිබූ අතර එය සමුච්චිත අරමුදලට ඇතුලත් කර ලේඛන නිවැරදි කර ඇති බව, ඉදිරි වර්ෂයට අදාළ වියදම් උපචිත වියදම් ලෙස ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කර ගිණුම්ගත කරන බව. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ගිවිසුම්ගත වටිනාකම් එකතුව රු. 1,308,785 ක් වූ පළාත් සභා කර්මාන්ත 04 ක් සඳහා ණයහිමි වටිනාකම් එකතුව රු. 9,774,366 ක් උපචිත කර දැක්වීමෙන් ජංගම වත්කම්, ජංගම වගකීම්, ප්‍රාග්ධන ආදායම හා ප්‍රාග්ධන වියදම රු. 8,465,581 ක් වැඩියෙන් දක්වා තිබුණි. | සියළු දෝෂයන් 2021 අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 15,144,320 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස්කම් සොයාබලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 1,968,712 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ගෙවීම් වෙනත් තැන්පතුවකින් සිදු වී ඇති නිසා මෙම දෝෂ සිදු වී ඇති බවත් ඉදිරියේදී ගිණුම්වලින් ගැලපීම් සිදු කර නිවැරදි කරන බව. | සාක්ෂි දැක්වීමට හැකි විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 36,237,276 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,711,216 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| (i) සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 19,944,474 ක් වූ හිඟ වරිපනම් ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකිරීමට ආදායම් පරීක්ෂකවරු දැනුවත් කර ආදායම් එකතු කිරීමට ඉලක්කයන් හා හිඟ ලැයිස්තු ලබාදුන්නද වසංගත තත්ත්වය හේතුවෙන් ආදායම් එකතු කිරීමේ දුෂ්කරතාවයන් පැවති අතර පනත ප්‍රකාරව කටයුතු කිරීමටද නොහැකි වූ බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 229,675 ක් වූ හිඟ අක්කර බදු ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල අක්කර බදු ඉඩම් පිළිබඳ තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කර දන්වන ලෙස 2020 ඔක්තෝබර් 16 දිනැති ලිපිය මඟින් ගොවිජන සේවා කාර්යාලයෙන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තොරතුරු ඉල්ලුම් කර ඇති බව. | අක්කර බදු සතොයක්ෂණයක් සිදු කර හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ආ) බලපත්‍ර ගාස්තු**

----------------

| | | |
|---|---|---|
| 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනා ගැනීමට සමාලෝචිත වර්ෂය තුළ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. ඒ අනුව, රු. 1,203,040 ක් වූ ඇස්තමේන්තුගත ආදායමින් රු. 375,967 ක් අයකර ගැනීමට නොහැකිව තිබුණි. තවද, ව්‍යාපාර වලින් පරිසරයට සිදුවන බලපෑම පිළිබඳ කාලීන ඇගයීමක් සිදු නොකිරීමෙන් සභා බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් සභාවේ වගකීම ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබුණි. | ප්‍රාදේශීය සභා බල සීමාව කි.මී.139 කින් යුක්ත වීම හා එක් නිලධාරියෙකුට පැවරී ඇති අනෙකුත් රාජකාරි කටයුතු සමඟ මේ සඳහා කැප කල හැකි කාලය අවම වීම යන සීමාකාරී සාධක සමඟින් සමීක්ෂණය සඳහා වැඩ පිළිවෙළක් සකස් කළ ද, පවතින කොවිඩ් තත්ත්වය හේතුවෙන් එම කටයුත්ත ද මඟ හැරී ඇති බව. | පවතින පරිසර නීතීන්ට අනුව කටයුතු කළ යුතුය. |

**(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 17,021,579 ක් වූ අතර 2017 හා 2018 වර්ෂවල මුල් අර්ධ වර්ෂයට අදාලව ලැබිය යුතු බවට හඳුනාගෙන තිබූ උසාවි දඩ රු. 4,604,168 ක් විය. රත්නපුර උසාවියේ 2016 වර්ෂයේ සිට ද අවිස්සාවේල්ල උසාවියේ 2018 ජූලි සිට ද අයවිය යුතු උසාවි දඩ 2021 මාර්තු වනවිටත් හඳුනාගෙන නොතිබුණි. | දැනට පවතින කොවිඩ් අනතුර හේතුවෙන් 2017 හා 2018 වර්ෂවලට අදාලව සඳහන් කර ඇති උසාවි දඩ මුදල් අය කර ගැනීමට අවශ්‍ය තොරතුරු සපයා ගැනීමට උසාවි වලට යාමට නොහැකි වී ඇති බව. | සභාවට අයවිය යුතු ආදායම් කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තැන්පතු ගිණුම් 03 ක පවතින එකතුව රු.8,191,137 ක හර ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමටද එම ශේෂ සත්‍යාපනය කිරීම සඳහා අවශ්‍ය ලිඛිත තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කිරීමට ද සභාව අපොහොසත් වුණි. | නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇහැලියගොඩ සතිපොළ වෙනුවෙන් 2012 වර්ෂයේදී අයවිය යුතු හිඟ බදු කුළී සම්බන්ධයෙන් වූ අධිකරණ තීන්දුව ප්‍රකාරව 2016 අප්‍රේල් වනවිට අයකර අවසන් විය යුතු වුවත්, රු. 180,000 ක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. අධිකරණ නියෝග ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අධිකරණය වෙත වාර්තා කර හිඟ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් සභාව අපොහොසත්ව තිබුණි. | මෙම මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කඩිනමින් සිදු කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | අධිකරණ තීන්දුව ප්‍රකාරව සභාවට අයවිය යුතු ආදායම් කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 ජූලි මස බදුදී තිබූ බහුකාර්යය ගොඩනැගිල්ලේ බිම් මහලේ පිහිටා ඇති කඩකාමර 10, සඳහා අයවිය යුතු එක්වන් මුදල් (Key Money) 2018 අගෝස්තු වනවිට අයකරගෙන අවසන් විය යුතු වුවද, කඩකාමර 06 ක් සඳහා අයවිය යුතු රු. 758,822 ක් 2020 දෙසැම්බර් වනවිටත් අයකරගෙන නොතිබුණි. එමෙන්ම එක්වන් මුදල ගෙවා අවසන් වන තුරු අයකළ යුතු මාසික කුළිය වෙනුවට එක්වන් මුදල් අයවීමෙන් පසු අයකළ යුතු මාසික කුළිය අයකර තිබීම හේතුවෙන් එක්වන් මුදල් නොගෙවූ කඩකාමර 06 ට අදාලව සභා අරමුදලට රු. 426,300 ක පාඩුවක් සිදුවී තිබුණි. තවද, පළාත් පාලන කොමසාරිස්ගේ 2009 මාර්තු 09 දිනැති අංක 2009/01 දරන චක්‍රලේඛයේ 2.5 ඡේදය ප්‍රකාරව සම්පූර්ණ පෙර ගෙවුම් මුදල ගෙවා අවසන් වූ පසු කඩකාමරයේ සන්තකය භාරදිය යුතු වුවත්, ඉහත කඩකාමර වල සන්තකය 2018 අගෝස්තු 08 දින භාරදී තිබුණි. | කී මනී මුදල් අයකර ගැනීම සඳහා බදුකරුවන් ලිපි මඟින් දැනුවත් කර ඇති බවත් මුදල් වාරික වශයෙන් ගෙවීම් සිදුකිරීමට අවස්ථාව ලබා දීම හේතුවෙන් අක් මුදල් අයවීමෙන් පසු මාසික කුලිය අය කර ගැනීමට කටයුතු කර ඇති බව. | අයවිය යුතු ආදායම් කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇහැලියගොඩ නගරයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ නගරයේ පාරට මායිම්ව පිහිටි ගොඩනැගිලි කොටස් ඉවත් කිරීමේදී, එම සුන්බුන් අවශ්‍ය ස්ථාන වලට රැගෙන යාමේ ප්‍රවාහන වියදම් ප්‍රාදේශීය සභාව මඟින් දැරීමට හා පසුව එම වියදම් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ප්‍රතිපූර්ණය කර ගැනීමට ඇති කරගෙන තිබූ වාචික එකඟතාවය මත 2013 වර්ෂයේදී අත්තිකාරම් වශයෙන් රු. 900,000 ක් සභා අරමුදලින් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එකී මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. තවද කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රු. 4,390,000 ක් වූ ඉතිරි මුදල් පිළිබඳ එළඹ තිබූ බැරකම පියවීමට නොහැකි වීම හේතුවෙන් හිඟ මුදලට අමතරව සිදුවූ අලාභය ලෙස රු. 2,634,000 ක වන්දි මුදලක්ද ඉල්ලමින් කොන්ත්‍රාත්කරු විසින් අධිකරණ ක්‍රියාමාර්ගයකට එළඹ තිබුණි. 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අධිකරණ කටයුතු සඳහා සභා අරමුදලින් රු. 17,000 ක වියදම් දරා තිබුණි. | ඇහැළියගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය ඉතා කඩිනමින් සිදුකල යුතු ව්‍යාපෘතියක් වූ බැවින් ගිවිසුම් අත්සන් නොකර හිටපු සභාපති සභාව දැනුවත් කර අදාල කටයුතු කර, බිල්පත් ලැබීමෙන් පසු ගිවිසුම් අත්සන් කර ඇති බවත් මේ සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් පවතින බව. | ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට පෙර ගිවිසුම්ගත වී විධිමත්ව ඉටු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ රු. 39,281,227 ක් වැයකර 2012 දෙසැම්බර් මස වැඩ අවසන් කර තිබූ ගැටහැත්ත බහුකාර්යය ගොඩනැගිල්ල 2018 වර්ෂය දක්වා නිෂ්කාර්යයව පැවති අතර, 2018 දෙසැම්බර් 31 දින රු. 100,000 ක මාසික කුළියකට වර්ෂයක කාලයක් සඳහා ගොඩනැගිල්ලේ පළමු මහල හා බිම් මහල බදු දී තිබුණි. කෙසේ වුවද බදුකරු විසින් ගොඩනැගිල්ලෙහි විවිධ අඩුපාඩු දක්වා ඒවා පිළිසකර කර දෙන ලෙස ඉල්ලමින් කුළී මුදල් ගෙවීම පැහැර හැර තිබූ අතර, සභා අරමුදලින් රු. 2,331,013 ක් වැය කර | බදුකුළී ගෙවන ලෙස වරින් වර බදුකරු වෙත ලිඛිත දැන්වීම් කළ බවත් බදුකරුට අයත් උපකරණ ද සමඟ මේ වනවිට ගොඩනැගිල්ල සභාව වෙත පවරා ගෙන ඇති බවත් බදුකරු විසින් පැහැර හරින ලද මුදල් අයකර ගැනීම සඳහා ගොඩනැගිල්ල තුල ඇති සෞඛ්‍ය උපකරණ පිළිබඳව තක්සේරුවක් ලබා ගැනීමට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් නිලධාරීන් කණ්ඩායම් ලබා දීමට කටයුතු කරන ලෙස | සභාව සතු වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු අතර හිඟ කුළී අය කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| සියළු අලුත්වැඩියා කටයුතු නිම කර දී තිබියදී අරමුණුගත කාර්යය සඳහා ගොඩනැගිල්ල යෙදවීමට හා ගිවිසුම් ප්‍රකාරව කුළී ගෙවීමට කටයුතු කර නොතිබුණි. බදුකරු වැඩ ආරම්භ කළ දින සිට බදු මුදල් අයකර ගැනීමට 2019 ඔක්තෝබර් 08 දින පැවති මහා සභාවේ හදිසි යෝජනා යටතේ අනුමත කර තිබීම හේතුවෙන් 2020 දෙසැම්බර් වනවිටත් සභාවට කුළී ආදායම් අයකර ගැනීමට නොහැකි වී තිබූ අතර, අහිමි වී තිබූ ආදායම රු. 2,400,000 ක් විය. | ඉල්ලා ඇති බවත් මේ පිළිබඳව බදුකරු ද දැනුවත් කර ඇති බවත් මේ වනවිට මෙම ගොඩනැගිල්ල නැවත ටෙන්ඩර් කිරීම සඳහා අවශ්‍ය තක්සේරු වාර්තාවක් ලබා දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇති බව. | |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**
-----------------------------------------

**4.1 පාරිසරික ගැටලු**
------------------

| විගණන නිරීක්ෂණය<br>------------------- | සභාවේ අදහස් දැක්වීම<br>----------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල සමාලෝචිත වර්ෂයේ ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1500 ක් පමණ බැහැර කිරීම සඳහා රු. 16,041,867 ක පිරිවැයක් හා කාර්යය මණ්ඩල සේවකයින් 21 දෙනෙකු ද වාහන 04 ක් ද යොදවා තිබුණි. එසේ වුවද, එම අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත් හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් බැහැරව භූමියේ වලවල් හාරා ඒ තුළට අපද්‍රව්‍ය බැහැර කර වලවල් වසා දමා තිබුණි. | රට තුල පවතින කාබනික පොහොර භාවිතය පිළිබඳ කථිකාවත හමුවේ කසළ එකතු කරන අතර, එම කසළ වලින් පොහොර නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා ඝන අපද්‍රව්‍ය සැලැස්මක් ඉදිරි කාලය තුල සකස් කිරීමට කටයුතු කරන බව. | ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කළ යුතුය. |